# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 17 දරන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2008 මාර්තු මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2008 මාර්තු මස 14 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු.5.00 යි.

# 2008 අංක 17 දරන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2008 මාර්තු මස 13 වන දින]

එල්. ඩී. — ඕ 28/2005

## පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය බෞද්ධ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව සංගමයේ පරමාර්ථ සහ ඊට අදාළ වූ කරුණු සඵල ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා, මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින්ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2008 අංක 17 දරන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය බෞද්ධ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය බෞද්ධ සංගමය යන නාමය හා අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය භාවිත කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බෞද්ධාගම සහ බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා කර ගනිමින් බෞද්ධ ආගමික කටයුතු ඉටු කිරීම සඳහා සාමාජිකත්වය මෙහෙයවීම ;

2-PL 002604 - 2,700 (2007/11)

ආ) සංගමයේ සාමාජිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් දැහැමි දිවි පෙවෙතක් සඳහා යොමු කිරීමට අවශ්‍ය දාන, සීල, භාවනා සහ ඒ හා සමාන ව්‍යාපෘතීන් ආරම්භ කොට පවත්වා ගෙන යාම ;

ඇ) මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය භාවිතය මගින් බෞද්ධාගමික කටයුතු නගා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

ඈ ඉහත සඳහන් පරමාර්ථවලට අනුකූල වෙනත් දේශීය හෝ විදේශීය සංවිධාන සමග සහයෝගීව බෞද්ධාගමික කටයුතු ඉටු කිරීම ;

සංස්ථාවේ පොදු බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ සහ ලබාගැනීමේ ද, සම්මාදම් මුදල්, ආධාර මුදල් හෝ පරිත්‍යාග හෝ ගැනීමේ හා එකතු කිරීමේ ද ස්වකීය මුදල් ආයෝජනය කිරීමේ සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ සහ සේවයෙන් ඉවත් කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියලු ක්‍රියා, කාරණා සහ දේවල් ඉටු කිරීමේ. කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය. :—

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණ කමිටුවක් විසින් සංස්ථාවේ 6 වන වගන්තියට අනුකූලව සාදන් ලද රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) කළමනාකරණ කමිටුව සභාපතිවරයකු, උප සභාපතිවරයකු, ප්‍රධාන ලේකම්වරයකු උපලේකම්වරයකු, භාණ්ඩාගාරිකවරයකු, ප්‍රධාන සංවිධායකවරයකු සහ කාරක සභිකයන් විසි එක් දෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය.

(3) සංස්ථාවේ පළමුවන කළමනාකරණ කමිටුව මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ සංගමයේ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඉවත්වීම, ඉල්ලා අස්වීම, විශ්‍රාම යාම හෝ ඔවුන්ගේ ඉවත් කිරීම සඳහා ද කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සඳහා ද, කළමනාකරණ කමිටුවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්යය ඉටු කිරීම සම්බන්ධයෙන් ද සංස්ථාවේ සහ කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල දී කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කර ගැනීම මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ලැබූ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයකින් සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. එවැනි රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයකින් වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාව විසින් සාදන ලද රීතියක් එවැනි රැස්වීමක දී සහ එවැනිම ආකාරයට (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් ලෙස සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද යම් වෙනස් කිරීමක්, එකතු කිරීමක්, සංශෝධනය කිරීමක් හෝ පරිච්ඡින්න කිරීමක් සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් අනුමත කරන ලද්දේ නම් මිස බලාත්මක නොවිය යුතු ය.

(3) සංස්ථාවේ සෑම සාමාජිකයකුම සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ ගිණුම් හා විගණනය.

7. (1) සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් සංස්ථාවේ ආදායම් හා වියදම් පිළිබඳ විධිමත් ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සංස්ථාවේ ගිණුම් විගණනය කළ යුත්තේ ය.

3 මේ වගන්තියෙහි ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන්—

අ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු

වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එවැනි ආයතනයක පාලක සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇත්තා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) ගණකාධිකාරී ව්‍යාපාරික ආයතනයක එක් එක් වාසික හවුල්කරු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවනු ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ පාලක සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් තමා සතුව ඇත්තා වූ ද, ගණකාධිකාරී ව්‍යාපාරයක්,

අදහස් වේ.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ රීතිවලට යටත්ව, ඒ සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

9. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ සභාපති සහ සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට අනුකූලව තත් කාර්ය සඳහා බලය පවරනු ලැබූ සංස්ථාවේ කළමනාකරණ කමිටුවේ යම් සාමාජිකයකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. ඒ දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම අත්සන තැබිය යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

10. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාර ගන්නා ලද හෝ මින් මතු භාර ගනු ලබන ත්‍යාග, රිත්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි එක් බැංකුවක හෝ වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

11. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ පැවති සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ පනහාගි මුදල් මේ පනතේ කාර්ය සඳහා මෙයින් ඇති කරන ලද සංස්ථාවට ගෙවිය යුතු ය.

*සංස්ථාවෙන් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.*

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරිවුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව ඒවායේ යම් දේපළක් හෝ ආදායමක් ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එකී ආයතනය හෝ ආයතන, සංස්ථාවේ සාමාජිකයන් විසින් සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුවම නිශ්චය කරනු ලැබිය යුතු ය.

*විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපළ.*

13. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*ජනරජයේ හා අනායන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම*

14. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල හා පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1.160 කි. අංක 163. කිරුළපන මාවත. පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.